**කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය - 2016**

**--------------------------------------------------------**

වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2008 අංක 31 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 47 (2) වගන්තිය සහ 2014 ඔක්තෝබර් 03 දිනැති අංක 1882/51 දරන අති විශේෂ ගැසට් නිවේදනයේ 17 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල පනතේ 49 (1) වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාල විද්‍යායතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතුයැයි අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විද්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විද්‍යායතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

----------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලයට අනුබද්ධ කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දැනට භාවිතයේ පවතින කුලියාපිටිය විශ්වවිද්‍යාල විද්‍යායතනය පිහිටි හෙක්ටයාර් 5.42 ක ඉඩම හා 2016 වර්ෂයට පෙර ඉදිකරන ලද ගොඩනැගිලි වටිනාකම් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ඉදිකරන ලද රු.11,775,208 ක් වූ ගොඩනැගිලි වටිනාකමින් රු.10,661,197 ක් පමණක් ගිණුම්ගත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම රු.1,114,011 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවියයුතු රු.33,000 ක් වූ ප්‍රවාහන වියදම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඈ) ආපසු ගෙවිය යුතු පුස්තකාල තැන්පතු රු.163,500 ක් බැරකම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ශිෂ්‍ය සුභසාධක අරමුදලකට මාරු කර තිබුණි.

### 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 756 (1) | සමාලෝචිත වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය 2016 දෙසැම්බර් 14 දින පත්කර තිබුණද, භාණ්ඩ සමීක්ෂණය කටයුතු නියමිත දිනට නිමකර නොතිබුණි. |
| (ආ) | 2015 ජුලි 06 දිනැති අංක එස්ඊසී/2015/05 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ චක්‍රලේඛයේ 06 ඡේදය හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | බාහිර කථිකාචාර්යවරුන් සඳහා දීමනා ගෙවීමේදී අයකර ගතයුතු රු.11,950 ක් වූ උපයන විට බදු ගෙවීම් අඩුකරගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | රාජකාරි නිවාස දුරකථන, ජංගම දුරකථන හා අන්තර්ජාල පහසුකම් සඳහා වූ අනුමත සීමාවන් ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකුට රු.71,603 ක් ගෙවා තිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

-----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාල විද්‍යායතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.1,912,306 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.667,134 ක් වීමෙන් ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,579,440 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. සමාලෝචිත වර්ෂය තුල පුනරාවර්ථන ප්‍රදානයන්හි රු.12,095,935 ක් වූ වැඩිවීම ඉහත වර්ධනයට බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයෙහි මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලයේ අතිරික්තයක් පැවතුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික නැවත ගැලපීමේදී විශ්වවිද්‍යාල විද්‍යායතනයේ 2015 වර්ෂයේ රු.15,192,720 ක්වූ දායකත්වය 2016 වර්ෂයේදී රු.25,683,276 ක් වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

------------------------------

**4.1 කාර්යසාධනය**

--------------------

2014 අංක 01 දරන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතන නියමාවලියට අනුව ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ හා සමාන මට්ටම්වල වෙනත් තාක්ෂණවේදී පාඨමාලා මෙහෙයවීම විද්‍යායතනයේ අරමුණු ලෙස දක්වා තිබුණි. එම අරමුණු ඉටුකර ගැනීමේ කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය විසින් අනුමත ජාතික වෘත්තීය සුදුසුකම් 5,6 හා 7 මට්ටමේ පාඨමාලා සහ ඒ සමාන මට්ටම්වල පාඨමාලා 09 ක් හඳුන්වාදී තිබුණද ශීතකරණ හා වායු සමීකරණ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා කථිකාචාර්යවරුන් බඳවා ගැනීමට නොහැකිවීම හේතුවෙන් එම පාඨමාලාව ආරම්භ කර නොතිබුණි. පාඨමාලා 08 ක් සඳහා සිසුන් 238 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර, එම සිසුන්ගෙන් 09 දෙනෙකු පාඨමාලා හැරගොස් තිබුණි.

(ආ) සියළුම පාඨමාලවන් සඳහා 2016 ජූලි මාසයේදී පවත්වන ලද ජාතික වෘත්තීය පුහුණු පාඨමාලා 5-2 අවසන් විභාගයේ පිළිතුරු පත්‍ර තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් දෙවනවර පරීක්ෂා කර ප්‍රතිඵල ලබාදීම ප්‍රමාදවීම හේතුවෙන් 2017 අප්‍රේල් මාසය වන විටත් එම ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි. තවද 2016 ජූලි 21 දින වනවිට අවසන් කර තිබූ ජාතික වෘත්තීය පුහුණු පාඨමාලා 5 මට්ටමේ දෙවන වසර විභාග පිළිතුරු පත්‍ර දෙවනවර පරීක්ෂාව සඳහා තෘතීය සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව වෙත සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක් යොමු කර නොතිබුණි.

(ඇ) සියළුම පාඨමාලාවන් සඳහා 2016 ජූලි මාසයේදී පවත්වන ලද පදනම් විභාගය සඳහා පෙනීසිටි සිසුන් 231 දෙනෙකුගෙන් 56 දෙනෙකු විභාගයෙන් අසමත් වී තිබූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 24 ක අගයක් ගෙන තිබුණි. සිසුන් ඉංජිනේරු මට්ටමේ තාක්ෂණික විෂයය ධාරාවක් සඳහා හැඩ ගැසීමේ ප්‍රවීනතාවය ඉතා අවම මට්ටමක පැවතීම සිසුන් අසමත්වීමට හේතුව වශයෙන් විශ්වවිද්‍යාල විද්‍යායතනයේ පාලන අධ්‍යක්ෂකගේ අදහස වී තිබුණි.

(ඈ) පාඨමාලා 06 ක ප්‍රායෝගික පුහුණුව සඳහා බාහිර ආයතන වෙත අනුයුක්ත කළ සිසුන් සංඛ්‍යාව 98 ක් වූ අතර ඉන් සිසුන් 35 දෙනෙකු පුහුණුව අතරමග හැරගොස් තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.15,374,800 ක් වූ වාහන 02 ක අයිතිය විද්‍යායතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ නිපුණතා සංවර්ධන පුහුණු ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු රු.30,912,106 ක මුදලට අදාල ව්‍යාපෘතීන් නිසි පරිදි සැලසුම් නොකිරීම හා කළමනාකරණය නොකිරීම හේතුවෙන් රු.3,091,406 ක මුදලක් රත්මලාන වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය වෙත ආපසු යැවීමට සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ රු.1,846,434 ක වියදමක් දරා ඉදිකරන ලද මෝටර් රථ ගරාජය හා රු.1,787,900 ක් වැයකර ඉදිකරන ලද යාන්ත්‍රික වැඩ ඒකකය විදුලිය හා අනෙකුත් යටිතල පහසුකම් නොමැතිවීම හේතුවෙන් භාවිතයට ගත නොහැකිව පැවතුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තෙකලා විදුලි පහසුකම් නොමැතිවීම හේතුවෙන් මෝටර්රථ (Automobile) අංශයේ ඇතැම් උපකරණ ක්‍රියාත්මක කළ නොහැකිවීමේ තත්ත්වය මත සිසුන්ට අදාල පුහුණුව සම්පූර්ණයෙන් ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ශිෂ්‍යයින් 229 දෙනෙකුගෙන් රු.343,500 ක් වූ ආපසු ගෙවනු ලබන පුස්තකාල තැන්පතු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රූපලාවන්‍ය පාඨමාලාව සඳහා අනුමත කර තිබූ රු.400,000 ක් වටිනා ලී බඩු හා උපකරණ මිලදී ගැනීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 07 කදී මිලදීගෙන තිබූ රු.289,307 ක් වටිනා පරිගණක මුද්‍රිත තීන්ත (Toner Cartridge) තොග පොතට ඇතුළත් කර නොතිබුණු අතර ඒවා නිකුත් කිරීම සම්බන්ධයෙන්ද කිසිදු තොරතුරක් නොවීය.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

ශීතකරණ හා වායුසමීකරණ තාක්ෂණවේදී පාඨමාලාව සඳහා රු.41,061,371 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ලබාදී වසර 02 ක් ගතවී තිබුණද පාඨමාලාව ආරම්භ නොකිරීම හේතුවෙන් එම යන්ත්‍ර සූත්‍ර නිෂ්ක්‍රීයව පැවතුණි.

## 4.5 ප්‍රසම්පාදන ක්‍රියාවලිය

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මුළු පිරිවැය ඇස්තමේන්තුව සියයට 62 කින් ඉක්මවා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 05 කදී රු.3,449,657 ක් වටිනා ලී බඩු හා උපකරණ නිසි අනුමැතියකින් තොරව මිලදී ගෙන තිබුණි.

(ආ) විභාග ශාලා පුටු 100 ක් මිලදී ගැනීමේදී රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් ඉදිරිපත් කරන ලද එකක් රු.4,880 ක් වූ අවම මිල නොසලකා හැර එකක් රු.6,549 බැගින් පෞද්ගලික ආයතනයකින් මිලදීගැනීම හේතුවෙන් රු.166,900 ක පාඩුවක් සිදුවී තිබුණි.

**4.6 කාර්ය මණ්ඩල පරිපාලනය**

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩල විස්තරය අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දේශකවරුන් 08 ක් හා ප්‍රදර්ශකවරුන් 02 ක්ද, අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ කළමනාකාර සහකාරවරුන් 03 ක්ද වශයෙන් තනතුරු 13 ක් පුරප්පාඩුව පැවතුණි.

(ආ) පුරප්පාඩු වී තිබෙන තනතුරු සඳහා දේශකවරුන් බඳවා නොගැනීම හේතුවෙන් රු.1,108,725 ක මුදලක් බාහිර දේශකවරුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ ගෙවීමට සිදුවී තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**5.1 ක්‍රියාකාරී සැලැස්ම**

---------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලැස්ම සකස්කර තිබුණද ඒ සඳහා පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණු අතර එය කාලානුරූපීව සමාලෝචනය කර යාවත්කාලීන කිරීමද සිදුකර නොතිබුණි.

**5.2 විගණන කමිටු**

-----------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 ඡේදය ප්‍රකාරව විගණන කමිටුවක් පත්කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

-----------------------

විගණන හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009 (1) මාර්ගෝපදේශ සංග්‍රහයේ 03 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවිය යුතු වුවත්, විශ්වවිද්‍යාල විද්‍යායතනය ආරම්භ වී වසර 02 ක් ගතවී තිබුණද එම ඒකකය පිහිටුවීමට කටයුතු කර නොතිබුණි.

**5.4 ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2015 දෙසැම්බර් 31 දින විටත් පිළියෙල කර නොතිබුණි.

**5.5 අයවැය ලේඛනමය පාලනය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව විශ්වවිද්‍යාල විද්‍යායතනය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර තිබුණද අදාල වර්ෂය ආරම්භවීමට මාස 03 කට පෙර පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) වැය විෂයයන් 12 ක අයවැය ගත වියදම්වල එකතුව රු.23,933,279 ක් වූ අතර ඒවායේ තථ්‍ය වියදම්වල එකතුව රු.15,456,394 ක් වූයෙන් සියයට 13 සිට සියයට 210 දක්වා පරාසයක විචලනයන් විය. ඒ අනුව අයවැය ලේඛනය මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විද්‍යායතනයේ අධ්‍යක්ෂකගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | තැන්පත් ගිණුමක් හරහා ගිණුම්ගත කළ යුතු රඳවා ගත් මුදල් ඉදිරි ගෙවීම් ලෙස ගිණුම්ගත කිරීම. |
| | | (ii) | ලෙජර ගිණුම් ශේෂ කර නොතිබීම. |
| | | (iii) | ජර්නල් සටහන් ලෙජර් ගිණුම්වල ඇතුළත් නොකිරීම. |
| (ආ) | ස්ථාවර වත්කම් පාලනය | (i) | ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු නොකිරීම. |
| | | (ii) | දේපල පිරියත හා උපකරණ පන්තිය නිසි ලෙස වර්ගීකරණය නොකිරීම. |
| | | (iii) | ආදායම් හා වියදම් ගිණුම්ගත කිරීමේදී භාවිතා කර තිබුණු සංකේත අංක ක්‍රමය නිවැරදිව භාවිතා නොකිරීම. |
| (ඇ) | වාහන පාලනය | (i) | ධාවන සටහන් සම්පූර්ණ නොකිරීම. |
| | | (ii) | ඉන්ධන දහනය පරීක්ෂා නොකිරීම. |
| | | (iii) | වාහනභාර නිලධාරීන්ගේ අධීක්ෂණයන් සිදු නොවීම. |
| | | (iv) | ලොග් සටහන් පොත් නඩත්තු නොකිරීම. |
| (ඈ) | කාර්ය මණ්ඩල පරිපාලනය | (i) | කාර්ය මණ්ඩල පුරප්පාඩු සඳහා බඳවා නොගැනීම. |
| | | (ii) | බාහිර දේශකවරුන් සඳහා ගෙවීම් කිරීමට සිදුවී තිබීම. |
| (ඉ) | මෙහෙයුම් පාලනය | (i) | නියමිත කාලසීමාවන් තුළ පාඨමාලා අවසන් නොකිරීම. |
| | | (ii) | ප්‍රමාණවත් ප්‍රායෝගික පුහුණුවක් සිසුන්ට නොලැබීම. |
| | | (iii) | බාහිර පුහුණු ආයතනවලින් සිසුන්ට ප්‍රායෝගික පුහුණුවීම් ලබාගැනීමට සිදුවීම. |